# ක්‍රි. ව. 1815 ට පෙර පැවති පාලන සමයේ ශ්‍රී ලංකාවේ ආර්ථික ක්ෂේත්‍රයට මුස්ලිම්වරුන් දැක්වූ දායකත්වය

M.N.M. Minaz[1], M.A.B. Ahmad[2], M.J.F. Nilfa[3], S.M.M. Mazahir[4]

*[1,2,4]Department of Islamic studies, [3]Department of Arabic Language,*
*[1,2,3,4]South Eastern university of Sri Lanka*

minazsrilanka@gmail.com

**සංක්ෂිප්තය**

ශ්‍රී ලංකාව යනු සැලකිය යුතු ජන විවිධත්වයක් සහිත රාජ්‍යයකි. මෙම විවිධත්වය ඇතිවීම සඳහා මෙරට ඉතිහාසයේ සිදු වූ දේශපාලන, සමාජයීය, ආර්ථිකමය හා ආගමිකමය වශයෙන් වූ විවිධ සිදුවීම් බලපෑහ. ඒ අනුව නූතන අවධිය වන විට විශාල විවිධත්වයකින් යුතුව ගොඩනැගී ඇති ශ්‍රී ලාංකීය ජාතිය ගොඩනැගීම සඳහා විවිධ වූ ජාතීන් මෙම දේශයට කර ඇති සේවයන් විමසා බැලීම කළ යුතුව ඇත. ඒ සඳහා ඉතිහාසය පිළිබඳ ලියැවුණු ශාස්ත්‍රීය ග්‍රන්ථ ආශ්‍රිතව සිදු කළ මෙම අධ්‍යයනය මගින් අනාවරණය කරනුයේ අතීත සිංහල පාලන සමයේ මුස්ලිම්වරුන් විසින් ශ්‍රී ලංකා රාජ්‍යයට කළ ආර්ථිකමය දායකත්වයන් පිළිබඳව අධ්‍යනය කිරීමයි. එහිදී ඉතිහාසය ආශ්‍රිත ලිඛිත මූලාශ්‍ර උපයෝගී කර ගනිමින් දත්ත රැස් කර විශ්ලේෂණය කිරීමෙන් මෙම පර්යේෂනය සිදු කර ඇත. ඒ අනුව මෙම අධ්‍යයනය මගින් අවධාරණය වන්නේ මුස්ලිම්වරුන් ආර්ථිකමය වශයෙන් ශ්‍රී ලාංකීය නාමයට කීර්තියක් අත් කර දෙමින් විවිධ ක්ෂෙත්‍රයන් ඔස්සේ දේශීය වෙළදාම සහ නිශ්පාදන අංශ දියුණු කර ඇති බවත් ආර්ථිකමය අතින් රාජ්‍යය විවිධ දුශ්කරතාවන් වලට ලක් වූ අවධි වල දේශපාලන අංශ වලට උපකාරී වී ඇති බවයි. තවද රාජ්‍ය තාන්ත්‍රික සබදතා මගින් නව ආර්ථික අවස්ථා උත්පාදනයට දායක වෙමින් දේශයේ ක්‍රියාත්මක වූ බදු ප්‍රතිපත්ති වලට යටත් වී රාජ්‍යයේ ආදායම් වලට ද ප්‍රවාහන, නාවුක, වාරි සහ වරාය ක්ෂේත්‍රයන් හි දියුණුවට දායක වී බවයි. ඒ අනුව ඉතිහාසය ආශ්‍රිත ලිඛිත මූලාශ්‍ර උපයෝගී කර ගනිමින් දත්ත රැස් කර විශ්ලේෂණය කිරීමෙන් මෙම පර්යේෂනය සිදු කර ඇත. එමගින් ශ්‍රී ලංකාව නම් වූ රාජ්‍යය පැවතීමට විවිධ ජාතීන් කළ කැප කිරීම් අධ්‍යයනය කිරීමෙන් මෙහි ජීවත් වන සියලු ජන කොටස් අතර සංහිදියාව ගොඩනැගීම සහ ජාතික එක්සත්භාවය වර්ධනය කිරීම ද යටගිය ඉතිහාසය යලි සමාජය වෙත මතක් කර දීම සිදු කළ හැක. තවද විවිධ ජාතීන් හට තම අනන්‍යතාව සහිත ජන කොටස් විසින් මෙම භූමියට දායාද කළ අමරණීය සේවාවන් ඔවුන්ට අනුස්මරණය කරවමින් ඔවුන් ද දේශයේ ඉදිරි ගමනට එක්කාසු කළ හැකිය.

***කේන්ද්‍රීය වචන:** ශ්‍රී ලංකාව, වෙළදාම, රාජධාණිය, මුස්ලිම්වරු, ඉතිහාසය*


*ISBN: 978-624-5736-37-9*